**පානදුර ප්‍රාදේශීය සභාව**

**------------------------------**

**කළුතර දිස්ත්‍රික්කය**

**-------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 11 දින විගණනයට ඉදිරිපත් කර තිබූණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 26 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 23 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 අහිතකර මතය

----------------------

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 අහිතකර මතය සඳහා පදනම

-----------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

----------------------------

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|---|
| (i) | මූලධන ආධාර හා සේවා සඳහා ගාස්තු පිළිවෙලින් රු.12,144,102 ක් හා රු.206,217 ක් අඩුවෙන්ද ව්‍යාපාර හා කර්මාන්ත බදු ආදායම රු.75,040 ක් හා පොදු පරිපාලන වැඩසටහනෙහි වෙනත් ආදායම් රු.5,123,642 ක් වැඩියෙන්ද දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | පොදු පරිපාලන හා සෞඛ්‍ය සේවා වැඩසටහන් වල පුනරාවර්තන වියදම් රු.13,364,355 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නැවත පරික්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ , මෝටර්රථ හා කරත්ත, ලී බඩු හා සවිකිරීම් වටිනාකම් පිළිවෙලින් රු3,474,727 ,රු.7,500,831 , රු.2,337,635 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට ජාතික ඉතිරි කිරීමේ බැංකු ගිණුමේ ශේෂය රු.11,879,200 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | සේවක ඇප තැන්පත් හා සේවක ආයෝජන වටිනාකම පිලිවෙලින් රු.27,215 ක් හා රු.35,214 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | සභාවේ අභ්‍යන්තර මාරු කිරීම් ලෙජර් ගිණුම අනුව ශේෂය රු.115,206 වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.2,000,000 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.1,884,794 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) | කලින් ලද ආදායම් රු.1,670,655 ක් හා සමුච්චිත අරමුදල් ශේෂය රු.25,591,869 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.15,319,625 ක් වූ කර්මාන්ත ණයගැති වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ix) | මුද්දර ගාස්තු වලින් අඩුකර ගත් රු.4,494,000 ක් වූ කම්පැක්ටර් රථයේ ණය වාරික මුදල් ප්‍රාග්ධනිත කිරීමේදී මෝටර්රථ හා කරත්ත ගිණුමට හර නොකර ප්‍රාග්ධනයට ආධාර මගින් දායකවීමේ ගිණුම පමණක් බැර කිරීම හේතුවෙන් මෝටර්රථ හා කරත්ත වටිනාකම රු.4,494,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (x) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමියෝ රු.49,652,658 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදිව ගිණුම්ගත කල කරමි. |
| (xi) | හිඟහිටි වෙනත් ආදායම් ගිණුමේ ශේෂය නිවැරදි කිරීම ලෙස රු.13,010,221 ක් ඌනතා අතිරික්තතා ගිණුමට හර කර හිඟහිටි වෙනත් ආදායම් ගිණුම බැර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදිව ගිණුම්ගත කල කරමි. |
| (xii) | සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.1,665,403 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදිව ගිණුම්ගත කල කරමි. |
| (xiii) | වර්ෂය අවසාන තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරීම වෙනුවට රු.9,286,388 ක් වූ පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදිව ගිණුම්ගත කල කරමි. |
| (xiv) | ස්ථාවර තැන්පත් ආයෝජන වටිනාකම රු.755,388 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදිව ගිණුම්ගත කල කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.144,774,172 ක් වූ ගිණුම් විෂයන් 05 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 7,977,197 ක වෙනසක් විය. | අදාල ශේෂ වල වෙනස් කම් සසඳා ගිණුම් නිවැරදි කිරිමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය ලෙජරය අනුව රු.226,971,459 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.235,209,984 ක් ලෙස දක්වා තිබූ බැවින් රු.8,238,524 ක වෙනසක් පැවතුනි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | ස්ථාවර වත්කම් වල ගිණුම් ශේෂය හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ හා ප්‍රාග්ධනයට ආධාර මගින් දායකවීමේ ගිණුම් වල ශේෂය අතර රු.672,831 ක වෙනසක් විය. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට ලෙජරය අනුව එකතු කල අගය මත බදු ගිණුමේ ශේෂයක් නොමැති වුවත්, රු.3,070,174 ක ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන, අත්තිකාරම් ලේඛන , ණයගිමි ලේඛන, තැන්පත් ලේඛන හා විස්තරාත්මක උපලේඛන නොමැතිවීම නිසා එකතුව රු.154,839,847 ක් වූ ගිණුම් විෂයයන්10 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | අදාල ලේඛන මේ වනවිට යාවත්කාලීන කර ඇත. |

1.4 අනුකූල නොවීම

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

--------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | | | |
| (i) 134(1) වගන්තිය | | වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කල යුතුය. | නව හඳුනා ගැනීම් සඳහා වරිපනම් විස්තර පෝරම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල බෙදීමේ කටයුතු සිදු කරගෙන යන බව දන්වමි. |
| (ii) 149 වගන්තිය | | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබු හෝටල් 10 ක වර්ෂයේ සම්පූර්ණ ආදායමින් සියයට එකක් දක්වා වු ගාස්තුව අයකර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කල යුතුය. | 2019 නිවැරදි ලැයිස්තුවෙහි වර්තමාන තත්වය ලබාදී ඇති බව දන්වමි. |
| (iii) 160 වගන්තිය | 28,738,188 | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කල යුතුය. | දේපල තහනම් කිරීමේ නිලධාරියා විසින් හිඟ මුදල් වලින් කොටසක් එකතු කරගෙන ඇති බව දන්වමි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කල යුතුය. | සභාවේ ඉඩම් මැනීමේ කටයුතු ආරම්භ කර ඇති බව දන්වමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(1) හා (2) | 13,900,133 | කල් ඉකුත් වූ තැන්පතු කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. | ඉකුත් තැන්පතු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 වගන්තිය | - | සභාව සතු වාහන 48ක ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ වන විට වාහන කිහිපයක ඉන්ධන දහනය සිදු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 51,036,602 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.58,834,435 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල් කළ ආදායම | 2019 රැස් කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 37,819,124 | 35,127,666 | 32,007,426 | 29,666,989 | 25,631,310 | 31,760,665 | 18,422,124 | 26,544,049 |
| (ii) | කුලී | 8,138,260 | 2,555,800 | 2,251,059 | 304,741 | 2,151,108 | 3,056,252 | 2,785,165 | 3,587,342 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,025,400 | 693,000 | 744,500 | (51,500) | 350,000 | 625,200 | 573,700 | 51,500 |
| (iv) | වෙනත් ආදායම් | 77,869,500 | 77,000,000 | 14,691,164 | 62,308,835 | 70,425,500 | 63,500,000 | 79,174,655 | 60,468,348 |
| | | 124,852,284 | 115,376,466 | 49,694,149 | 92,280,565 | 98,557,918 | 102,931,577 | 104,886,619 | 90,651,239 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

(අ) වෙළඳ ස්ථාන කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| හිඟ ආදායම් වාර්තාව අනුව 2019 ජනවාරි 01 දිනට වෙළඳ ස්ථාන හිඟ කුලී රු.3,323,087 න් වර්ෂය තුල කිසිදු මුදලක් අයකර නොතිබුණි. | හිඟ කුලී අය කිරිමට කටයුතු කල යුතුය. | කෙසෙල්වත්ත කාර්යාලයේ අභාවිත පොලිස් ගොඩනැගිල්ලේ හිඟය වූ රු.2,434,612 ක මුදල කපා හැරිමටත් පැරණි වෙළඳ පොලෙහි අය වීමට ඇති හිඟ මුදල් සඳහා නඩු දමා ඇත. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 හා 2019 වර්ෂ වෙනුවෙන් උසාවි දඩ හා මුද්දර ගාස්තු වශයෙන් කිසිඳු මුදලක් ලැබී නොතිබුණ ද සභාවේ ගිණුම් තැබීමේ වැරදි ක්‍රමවේදය හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකල යුතු වේ. | ඉදිරියේදී මෙවැනි හිඟ ශේෂ සිදු නොවීමට වගබලා ගන්නා බව දන්වමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අතුරු ව්‍යවස්ථා<br>ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 06 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. | 2015 වර්ෂයේ බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කර ඇති අතුරු ව්‍යවස්ථා වන් 2016 වර්ෂයේදී ගැසට් පත්‍රයක් මගින් වැළඳගෙන ඇත. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| | | |
|---|---|---|
| 2019 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් රු.මි.218.3 ක ව්‍යාපෘති 17 ක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරිමට අපොහොසත් වී තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. | හදිසි ආපදා තත්වයන් මත ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් කරන ලද ව්‍යාපෘති වෙනස් කිරිමට සිදු වු බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| | | |
|---|---|---|
| (i) තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කිරීම සඳහා 2019 වර්ෂයේ ක්‍රියාකාරකම් 05 ක් ක්‍රියාත්මක කර එම ක්‍රියාකාරකම් මැන බැලීම සඳහා දර්ශක හඳුන්වා දී තිබුණත් ඒ පිළිබඳව පසු විපරම් කිරීමක් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පසු විපරම් කිරීමක් සිදු කරන බව දන්වමි. |
| (ii) ගර්භිණී මව්වරුන් 550 කට උපකරණ ලබාදීම සඳහා රු.1,375,000 ක මුදලක් වැය කර ලබාගත් උපකරණ වලින් රු.317,500 වටිනා උපකරණ කට්ටල 127 ක් 2020 ජුනි මාසය දක්වා ගබඩාවෙහි රඳවාගෙන තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කිරීමේ වැඩ සටහන් අරමුණු ඉටු වන පරිදි සිදු කල යුතුය. | ඉතිරි උපකරණ බෙදා දීමට කටයුතු කරන බව දන්වමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු | | |
| 2019 දෙසැම්බර් 31 දිනට තනතුරු 10 ක පුරප්පාඩු 15 ක් වු අතර, ආදේශක පදනමින් තුන්දෙනෙකු , අනියම් සේවකයින් තුන්දෙනෙකු හා ව්‍යාපෘති පදනමින් සේවකයින් 17 දෙනෙකු සේවයේ යොදා ගෙන තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. | තනතුරු 10 ක පුරප්පාඩු 15 ක් පවතින බව දන්වමි. |
| (ආ) අය නොවන සේවක ණය | | |
| මියගිය , ස්ථාන මාරු වී ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 13 දෙනෙකුගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.735,936 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගත යුතුය. | අදාල මුදල් අයකර ගැනිමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය
--------------------------------------

4.1 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ
----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවේ 1.2 (අ) (ii) ,(iii) ,(iv) , (v) , (vi) , (ix) , (xi) , (xii) , (xvi ) හා (xvii) ඡේද වලට අදාල නිරීක්ෂණ නිවැරදි කර නොතිබුණි.. | පසුගිය වාර්තාවේ අඩුපාඩු නිවැරදි කල යුතුය. | 2020 වර්ෂයේදී නිවැරදි කරමි. |